www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුෂ් 1945 යෝල්ටා ගිවිසුම හෙලා දකී

## Bush denounces the Yalta Treaty of 1945

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2005 මැයි 12**

විසි වන සියවස සන්සුන් මරනයක් ප්‍රතික්ෂේප කරයි. එහි නොවිසඳුනු පරස්පර විරෝධතාවන්ගේ සෙවනැලි වත්මන් දේශපාලනය මත තදින් පතිත වෙයි. අතීතය පිලිබඳ "හුදු" අනුස්මරනයක් වැනි දෙයක් තිබිය නොහැක. නියත වසයෙන් ම, ඉතිහාසය මතකයට නැංවීම වත්මන් දේශපාලන අවශ්‍යතාවන්ට සේවය කරයි.

යුරෝපයේ දී දෙවන ලෝක යුද්ධය අවසන් වීමේ 60 වන සංවත්සරය අනුස්මරනය කිරීම මේ සඳහා හොඳ නිදසුනකි. 1945 යෝල්ටා ගිවිසුම හෙලා දකිමින් ලැට්වියාවේ දී ඔහු පැවැත්වූ කතාව මගින් ජනාධිපති ජෝර්ජ් බුෂ් උත්සාහ කලේ, වත්මන් ඇමරිකානු මිලිටරිවාදයත් ලෝකයේ ඕනෑම තැනක පවතින, ස්වකීය අවශ්‍යතාවන්ට තර්ජනයක් ලෙස තමන් සලකන ඕනෑම රටකට ප්‍රහාර එල්ල කිරීමටත් එය ආක්‍රමනය කිරීමටත් වොෂිංටනයට ඇති ස්වයං-ප්‍රකාශිත අයිතියත් සඳහා දෘෂ්ටිවාදීමය යුක්තිකරනයක් සම්පාදනය කිරීමට යි.

"අප මීට දශක හයකට ඉහත දී ලබා ගත් ජයග්‍රහනය සමරන විට, අප අවධානය යොමු කරන්නේ ප්‍රහෙලිකාවක් පිලිබඳව" යැයි ජනාධිපති ප්‍රකාශ කලේ ය. "ජර්මනියේ විශාල කොටසක් සම්බන්ධයෙන් ගත් කල, පරාජය නිදහසට තුඩු දුනි. නැගෙනහිර හා මධ්‍යම යුරෝපයේ විශාල කොටසක් තුල, ජයග්‍රහනය මගින් ගෙන එනු ලැබුවේ වෙනත් අධිරාජ්‍යයක අයෝමය පාලනයයි. ජයග්‍රාහී දිනය ෆැසිස්ට්වාදයේ අවසානය සලකුනු කල නමුත් එය පීඩනය අවසන් කලේ නැත. යෝල්ටාහි ගිවිසුම මියුනිච් හා මොලටොව්-රිබන්ට්‍රොප් ගිවිසුම්වල අසාධාරන සම්ප්‍රදාය අනුගමනය කලේ ය. යලිත් වරක්, බලගතු ආන්ඩු සාකච්ඡා කල විට, කුඩා ජාතීන්ගේ නිදහස යම් ආකාරයකින් කැප කල හැකි දෙයක් විය. එහෙත් ස්ථාවරත්වය රැක ගැනීම වෙනුවෙන් මේ ආකාරයට නිදහස කැප කිරීමේ ප්‍රයත්නය මගින් ඉතිරි වූයේ බෙදුනු හා අස්ථාවර මහාද්වීපයකි. *මධ්‍යම හා නැගෙනහිර යුරෝපයේ දශ ලක්ෂ සංඛ්‍යාත ජනයා සිරභාරයට පත් කිරීම මතක් කෙරෙනු ඇත්තේ ඉතිහාසයේ දූවැන්තම වැරදිවලින් එකක් ලෙස ය.*" (අවධාරනය ඇඳිනි.)

මෙම ප්‍රකාශය කල පුද්ගලයා එක්සත් ජනපද ජනාධිපති වන හෙයින්, එය නියෝජනය කරන්නේ, එක්සත් ජනපදයේ ආන්ඩුව කලින් පැවති ආන්ඩුවක් විසින් ගන්නා ලද විදේශ පිලිවෙත් පිලිබඳ තීන්දුවක් පෙර නොවූ විරූ ආකාරයකින් ප්‍රතික්ෂේප කිරීම සහ හෙලා දැකීමයි. ජනාධිපති ෆ්‍රෑන්ක්ලින් ඩෙලානෝ රූස්වෙල්ට් දැන් ජනාධිපති බුෂ් විසින් අපරාධකරුවකු ලෙස ප්‍රසිද්ධියේ හෙලා දකිනු ලැබ ඇත -- ඉතිහාසයේ "දූවැන්තම වැරදිවලින්" එකක් සිදු කල පුද්ගලයකු විස්තර කල හැක්කේ වෙන කුමන ආකාරයට ද? කෙනෙකුට මෙසේ විමසිය හැකි යː ජනාධිපතිට යෝල්ටා ගිවිසුමට සන්සන්දනය කල හැකිව තිබුනේ අන් කවරාකාර "ඉතිහාසයේ වැරදි" ද? නාසින්ගේ මහා යුදෙව් සංහාරය?

යෝල්ටා ගිවිසුම් හෙලා දැකීම දිගු කලක් තිස්සේ එක්සත් ජනපදයේ දක්ෂිනාංශික දේශපාලන පූච්චානම්වල කොටසක් ලෙස පැවතුනි. අන්ත දක්ෂිනාංශයත් නැගෙනහිර යුරෝපය තුල සෝවියට් ආනුභාවය "ආපසු තල්ලු කල" යුතු යැයි ද සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය මුලුමනින් ම විනාශ කල යුතු යැයි පවා ද ඉල්ලා සිටි ඇමරිකානු රාජ්‍යය ඇතුලත කොටසුත් යෝල්ටා සැලකුවේ කොමියුනිස්ට්වාදයට යටත් වීමේ සංකේතය ලෙස ය. යෝල්ටා ගිවිසුම් වනාහි එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව කොමියුනිස්ට් කැරලිකාරිත්වයට නතු වීමේ ප්‍රතිඵලයක් ය යන කියාපෑම, සෙනෙට් සභික ජෝශප් මැකාතිගේ මූලිකත්වයෙන් ක්‍රියාවට දමුනු පශ්චාත්-දෙවන ලෝක යුද කාලීන දඩයම් සඳහා ඉන්ධන සම්පාදනය කලේ ය.

එහෙත් යෝල්ටා පිලිබඳ මෙම හෙලා දැකීම් තිබිය දී ම, ඇමරිකානු පාලක පන්තියේ වඩාත් ම බලසම්පන්න කොටස් තුල පැවති පොදු එකඟතාව වූයේ, ඔහු එහි දී මුහුන දුන් කොන්දේසි යටතේ බලාපොරොත්තු විය හැකි තරම් හොඳින් රූස්වෙල්ට් යෝල්ටාහි දී තම කාඩ් අත සෙල්ලම් කල බවයි. ඔහු පෝලන්තයේ හා නැගෙනහිර යුරෝපයේ විශාල ප්‍රදේශයක අධිපති සෝවියට් ක්‍රියාකලාපයක් පිලිගැනීම මිලිටරි හා දේශපාලනික යථාර්ථයන් පිලිගැනීමට වඩා වැඩි දෙයක් නොවී ය. සෝවියට් හමුදාව එකල යුරෝපා මහාද්වීපය මත සිටි බලගතුම හමුදාව විය. නාසි යුද

යන්ත්‍රය විනාශ කිරීම සාක්ෂාත් කර ගැනුනේ මූලිකව ම සෝවියට් හමුදාව විසිනි. ජර්මානු හමුදාවන්ගේ දැවැන්ත කොටසක් යොදවා තිබුනේ නැගෙනහිර පෙරමුනෙහි ය. 1943 හා 1944 සෝවියට් හමුදාවන් ලැබූ ජයග්‍රහන නොමැතිව ඇංග්ලෝ-ඇමරිකානු හමුදාවල ප්‍රන්ස ආක්‍රමනය ගැන සිතා ගැනීමටත් නොහැකි විය හැකිව තිබුනි.

නැගෙනහිර යුරෝපය ජර්මානු වාඩිලෑමෙන් නිදහස් කර ගැනීමේ ක්‍රියාදාමය තුල දී, සෝවියට් සංගමය දැවැන්ත මනුෂ්‍ය හා ද්‍රව්‍යමය සම්පත් විනාශයක් අත්විඳ තිබුනි. නාසි ජර්මනිය අතින් විනාශයට ලක් වීමේ ආසන්නයට ම ගොස් සිටි සෝවියට් සංගමය, නැගෙනහිර යුරෝපයෙන් සිය හමුදා ඉවත් කර ගෙන, නව ආක්‍රමනික සභාගයක කොටසක් විය හැකි සතුරු ආන්ඩු යලි පිහිටුවීමක් අවිරෝධීව පිලිගැනීමට සූදානම් නැති වග රූස්වෙල්ට් තේරුම් ගත්තේ ය. ඉතිහාසඥ එරික් ඕල්ටර්මන් මෑත දී සටහන් කර ඇති පරිදි, මෙක්සිකෝවේ සෝවියට්-හිතැති ආන්ඩුවක් ගොඩනැගීම පිලිගැනීමට එක්සත් ජනපදය සූදානම් නොවූයේ යම් සේ ද එලෙස ම පෝලන්තයේ ඇමරිකානු-හිතැති ආන්ඩුවක් පිහිටුවීම පිලිගැනීමට සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය සූදානම් නොවී ය. (*When Presidents Lie* (ජනාධිපතිවරු බොරු කියන කල), නිව් යෝර්ක්: 2004, 37-38 පිටු)

බුෂ්ගේ ලැට්වියානු ප්‍රකාශයෙන් එලඹිය හැකි එක ම දේශපාලන නිගමනය නම්, නැගෙනහිර යුරෝපයෙන් සෝවියට් හමුදා ඉවත් කරගැනීම සාක්ෂාත් කරගනු වස් එක්සත් ජනපදය මිලිටරි ක්‍රියාමාර්ග ගත යුතුව තිබුනි යැයි ඔහු විශ්වාස කරන බවයි. 1945 දී මෙය සිදු කිරීමට නම්, වොෂිංටනය නාසි ජර්මනිය සමග වෙනම සාම ගිවිසුමක් ඇති කර ගෙන නාසි ජර්මනියේ මිලිටරි හමුදාවන්ගෙන් ඉතිරිව පැවති කොටස් සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයට එරෙහි ඒකාබද්ධ ජර්මානු-ඇමරිකානු යුද ව්‍යායාමයක් සඳහා යලි යෙදවීමක් අවශ්‍යව තිබුනි.

එස්එස් හමුදාවේ නායක හෙන්රිච් හිම්ලර් වැනි ප්‍රධාන නාසි නායකයන් මෙන් ම ජෙනරාල් ජෝර්ජ් පැටන් වැනි ඇමරිකානු මිලිටරි අනදෙන මන්ඩල තුල සිටි කොටස් පවා, සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වූ දේශපාලනික සිද්ධියකි මෙය. කෙසේ වෙතත්, ඇමරිකානු දේශපාලන සංස්ථාපිතයේ බලසම්පන්න ම කොටස් තුල මෙම ක්‍රියාදාමය ශක්‍ය විකල්පයක් ලෙස කොහෙත් ම සැලකුනේ නැත. මිලිටරිමය ලෙස කල නොහැකි දෙයක් වනවාට අමතරව, නාසීන් සමග වෙනම සාමයක් ඇති කර ගැනීම හා සෝවියට් සංගමයට ප්‍රහාර එල්ල කිරීම, ඇමරිකානු හමුදාව තුල ම කැරැල්ලක් ද රට තුල ඇමරිකානු ජනතාව අතර දැවැන්ත දේශපාලන විරෝධතා ව්‍යාපාරයන් ද අවුලුවාලිය හැකිව තිබුනි. ඇමරිකානු යුද භටයන් සෝවියට් හමුදා භටයන් සැලකුවේ තමන්ගේ හෘදයංගම සහෝදරයන් ලෙස ය.

1945 දී එක්සත් ජනපදය තුල දේශපාලනික මනෝගතිය 1948 දීට වඩා බෙහෙවින් වෙනස් විය. ඇමරිකානු මහජනතාවගේ සැලකිය යුතු කොටස් සෝවියට් සංගමය සමග යුද්ධයක් ඇතිවීමේ අවකාශය පිලිගැනීමට සූදානම් වීමට පෙරාතුව, එක්සත් ජනපදය තුල තුන් වසරක අනවරත සෝවියට් විරෝධී ප්‍රචාරයක් හා රත්තන් දඩයම් කිරීමේ උමතු ව්‍යාපාරයක් අවශ්‍යව තිබුනි. මෙම ප්‍රචාරක ව්‍යාපාරයේ තීරනාත්මක කොටසක් වූයේ රූස්වෙල්ට් යෝල්ටාහි දී නැගෙනහිර යුරෝපය "පාවා දී" තිබුනි යන කියාපෑම යි.

නිරතුරුව ම සිදු වන පරිදි, බුෂ් පාලනාධිකාරය ගනන් බලන්නේ, ජනාධිපතිගේ ප්‍රකාශ මොන යම් හෝ බැරෑරුම් දේශපාලන හා ඓතිහාසික විශ්ලේෂනයකට භාජන කිරීම මාධ්‍ය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ යන කාරනාව මත ය. යලිත් වරක්, ඔහු අපේක්ෂාභංගත්වයට පත්ව නැත. "මධ්‍යම හා නැගෙනහිර යුරෝපයේ දශ ලක්ෂ සංඛ්‍යාත ජනයා සිරභාරයට පත් කිරීම" ගැන බුෂ් කල සඳහන අභියෝගයට ලක් කෙරී නැත. නැගෙනහිර යුරෝපීය රටවල සෝවියට් වාඩිලෑම, විකසිත වෙමින් පැවති ප්‍රජාතන්ත්‍ර පාලනයන් කෲර ලෙස පාගා දැමී ය යන හැඟීමට ඇමරිකානු ජනතාව අතහැර දමනු ලැබ ඇත.

සත්‍ය තතු බෙහෙවින් වෙනස් ය. නැගෙනහිර යුරෝපයේ පැවති තන්ත්‍රයන් දේශපාලන ප්‍රතිගාමීත්වයේ නරාවලවල් විය. දෙවන ලෝක යුද්ධය පිපිරීමට පෙරාතුව, පෝලන්තය පාලනය කරනු ලැබුවේ, දිවංගත මාෂල් පිල්සුඩ්කිගේ පසුප්‍රාප්තිකයන් විසින් මෙහෙයවුනු අර්ධ-මිලිටරි ආඥාදායකත්වයක් මගිනි. උමතු සහගත ලෙස සෝවියට් විරෝධී පිලිවෙතක් ගෙන ගිය පිල්සුඩ්කි තන්ත්‍රය, 1934 දී නාසි ආන්ඩුව සමග සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයට එරෙහිව එල්ල වුනු අනාක්‍රමනික ගිවිසුමක් අත්සන් කිරීම මගින්, හිට්ලර් සමග ගිවිසුමකට එලඹි ප්‍රථම යුරෝපීය ආන්ඩුව බවට පත් විය. හංගේරියාවේ, බල්ගේරියාවේ හා රුමේනියාවේ පැවති තන්ත්‍ර සියල්ල ම දෙවන ලෝක යුද්ධයේ දී නාසීන්ගේ නායකත්වයෙන් යුත් අක්ෂ පිලෙහි කොටස්කරුවන් බවට පත්ව තිබුනි. හංගේරියාවේ දී, අද්මිරාල් මික්ලොස් හෝර්තිගේ ආඥාදායකත්වය, යුද්ධයට පෙරාතුව පවා, තුන් වන රයිකය සමග සිය ආන්ඩුව පෙලගස්වා තිබූ අතර බල්ගේරියාව සමග එක්ව, 1941 මැයි මස යුගෝස්ලාවියාවේ නාසි ආක්‍රමනයට සහභාගි විය. ඉන් යන්තම් මසක් ඇවෑමෙන්, හංගේරියාව සෝවියට් සංගමය ආක්‍රමනය කිරීමෙහි ලා හිට්ලර් සමග එක් විය.

රුමේනියාව පාලනය කලේ මාෂල් ඉඔන් ඇන්ටොනෙස්කු නම් වූ ආඥාදායකයෙකි. ඔහුගේ

ආන්ඩුව 1940 නොවැම්බරයේ දී අක්ෂ පිලට එක් වූ අතර ජර්මානු හා රුමේනියානු ආර්ථිකයන් අතර සමීප බැඳීම් තහවුරු කර ගති. ඇන්ටොනෙස්කූ රුමේනියාවේ යුදෙව්වන්ට එරෙහි ජනඝාතන ව්‍යාපාරවලට දිරිදුන් අතර, හිට්ලර් සිය ආක්‍රමනය දියත් කල විට සෝවියට් සංගමයට හමුදා යැවී ය. රුමේනියානු හමුදා මගින් වාඩිලා ගැනුනු සෝවියට් සංගමයේ ප්‍රදේශ වන බෙසරබියා සහ බුකොවිනා තුල, යුදෙව් ජනයා සමූලඝාතනය කෙරුනි. ඔඩෙසාහි සිදු වූ භයංකර ජනඝාතනයක දී ද රුමේනියානු හමුදා ප්‍රධාන ක්‍රියාකලාපයක් ඉටු කලේ ය. එහි දී 280,000ක පමන ජනතාවක් මරනයට පත් වූ අතර ඔවුන් අතරින් බොහෝ දෙනෙක් යුදෙව්වන් ය.

බුෂ් සිය කතාව පැවැත්වූ ලැට්වියාව තුල දී, 15,000ක් ලෙස තක්සේරු කෙරුනු "දේශපාලනිකව විශ්වාස කල නොහැකි පුද්ගලයන්" සමග යුදෙව්වන් 75,000ක් ඝාතනය කෙරුනි. මෙම ජන ඝාතනය මෙහෙයවන ලද්දේ, අරජ්ස් කොමාන්ඩෝ වැනි ඒකක තුල සංවිධානය වී සිටි දක්ෂිනාංශික ලැට්වියානු ජාතිකවාදීන් විසිනි. මෙම කන්ඩායම් ජනඝාතන සිදු කල අතර ම ඔවුන් ඝාතනයට ලක් කිරීමට පෙර දස දහස් සංඛ්‍යාත ජනයා රුම්බුලා වනයේ පිහිටි වලවල් තුලට ගාල් කිරීමට නාසින්ට උදව් කලහ.

නාසින්ගේ පරාජයෙන් පසුව, මෙම රටවල සෝවියට් විරෝධී ආන්ඩු යලි ගොඩනැගීමට සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය අවසර දීමට ඉඩ තිබුනි යන්න කිසිසේත් ම සිතාගත නොහැකි කාරනාවකි.

බුෂ් පාලනාධිකාරයේ විකාර සහගත ඓතිහාසික විකෘත කිරීම්වලට අභියෝග කිරීමේ දී, යුද්ධයෙන් අනතුරුව නැගෙනහිර යුරෝපයේ ගොඩනගන ලද ස්ටැලින්වාදී තන්ත්‍රයන් වගවර්තනා කිරීම තබා, එම ප්‍රදේශවල පැවති සෝවියට් වාඩිලෑමට ආයිත්තම් පැලඳවීම අපගේ අභිප්‍රාය නොවේ. එහෙත් සෝවියට් පිලිවෙත පිලිබඳ මාක්ස්වාදී සහ සමාජවාදී විවේචනයට, ශීතල යුද කාලීන අධිරාජ්‍යවාදී දෘෂ්ටිවාදීන් විසින් ප්‍රචාරය කෙරුනු ආඥාදායකත්වයට එදිරිව ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ මිථ්‍යාවාදය සමග කිසිදු පොදු බවක් නැත.

සෝවියට් පශ්චාත් යුද කාලීන පිලිවෙත පිලිබඳ මාක්ස්වාදී විවේචනය, නැගෙනහිර හා මධ්‍යම යුරෝපයේ සෝවියට් පිලිවෙතෙහි පැවති සාරභූත ලෙස ම තත්වානුරක්ෂක සහ ප්‍රතිවිප්ලවවාදී ස්වභාවය පැහැදිලි කරයි. සෝවියට් පිලිවෙත මෙහෙයවුනේ ජාත්‍යන්තර විප්ලවවාදී මූලෝපායක් මගින් නොව, ජාතික ආරක්ෂාව පිලිබඳ සම්ප්‍රදායික උත්සුකයන් මගිනි.

සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ වාටිය ඔස්සේ අනුගාමික රාජ්‍යවලින් යුක්ත ආරක්ෂක බෆරයක් ගොඩනැගීමට උත්සාහ කරන අතර ම, පාලක සෝවියට් නිලධරය බටහිර යුරෝපය පුරා ධනවාදයේ ආරක්ෂාව පිලිබඳ සහතිකයක් සැපයී ය. යුද්ධය අවසන් වීමත් සමග ම පැන නැගි කම්කරු පන්තියේ විප්ලවවාදී ව්‍යාපාර මැඩලීමෙහි ලා ස්ටැලින්වාදීන් ඉටු කල ක්‍රියාකලාපය, දීර්ඝ කාලීනව ගත් කල, සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ අවසන් විනාශය සම්බන්ධයෙන් තීරනාත්මක අර්ථභාරී කාරනාවක් බවට සනාථ විය.

ලැට්වියාවේ දී සිදු කල බුෂ්ගේ වාචාල කතාව මගින් පූර්ව-භංග යුද්ධය පිලිබඳ ධර්මය අවධාරනය කෙරෙයිඃ එනම්, "ප්‍රජාතන්ත්‍රවාදය" තර්ජනයට ලක්ව ඇති ඕනෑම අවස්ථාවක දී හා ඕනෑම තැනක දී යුද්ධයේ පිහිට පැතීමට එක්සත් ජනපදය නොපැකිලෙනු ඇත. නැතිනම්, එය වඩා නිශ්චිත ලෙස ප්‍රකාශ කල හොත්, මූලික ඇමරිකානු අවශ්‍යතා අවදානමට ලක් වන ඕනෑම අවස්ථාවක දී හා ඕනෑම තැනක දී යුද්ධයේ පිහිට පැතීමට එක්සත් ජනපදය නොපැකිලෙනු ඇත.

© www.wsws.org